Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ගුරු සේවා ව්‍යවස්ථාවට අනුකූලව 3 පන්තිය හා 2 පන්තියේ

# ගුරුවරුන්ගේ I වන II වන කාර්යක්ෂමතා කඩඉම් සඳහා පුහුණු සැසි

## පුහුණු මොඩියුලය

## නොවිධිමත් අධ්‍යාපනය හා මෘදු කුසලතා

2015

එච්.පී.එන්.ලක්ෂ්මන්

අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ගුරු සේවා ව්‍යවස්ථාවට අනුකූලව 3 පන්තිය හා 2 පන්තියේ ගුරුවරුන්ගේ I වන II වන කාර්යක්ෂමතා කඩඉම් සඳහා පුහුණු සැසි

## පුහුණු මොඩියුලය

## නොවිධිමත් අධ්‍යාපනය හා මෘදු කුසලතා

2015

නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ගුරු සේවා ව්‍යවස්ථාවට අනුකූලව 3 පන්තිය හා 2 පන්තියේ ගුරුවරුන්ගේ I වන II වන කාර්යක්ෂමතා**

**කඩඉම් සඳහා පුහුණු සැසි පැවැත්වීම. 2015**

**1.0 මොඩියුලයේ නම** : නොවිධිමත් අධ්‍යාපනය හා මෘදු කුසලතා

**2.0 අරමුණු**

2.1 අනිවාර්ය අධ්‍යාපන නියෝග අනුව ළමයින්ට අධ්‍යාපනය ලබාදීමේ අවශ්‍යතාවය ගුරුවරුන් තුළ ජනිත කිරීම.

2.2 නොවිධිමත් අධ්‍යාපනය යටතේ ක්‍රියාත්මක වන මූලික සාක්ෂර වැඩසටහන්, වැඩිහිටි සාක්ෂර වැඩසටහන්, වෘත්තිය පුහුණු වැඩසටහන්, පෞරුෂ සංවර්ධන වැඩසටහන් ආදිය පිළිබඳ ව ගුරුවරුන්ගේ දැනුම ප්‍රවර්ධනය කිරීම.

2.3 පාසල් සිසුන් අතර සිටින විශේෂ අවශ්‍යතා සහිත සිසුන් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, හා අධ්‍යාපන සැලසීම පිළිබඳව ගුරුවරුන්ගේ දැනුම ප්‍රවර්ධනය කිරීම.

2.4 සිසුන්ට ඵලදායි අධ්‍යාපනයක් ලබා දීම සඳහා වර්ධනය කරගත යුතු මෘදු කුසලතා පිළිබඳව ගුරුවරුන්ගේ දැනුම හා කුසලතා ඉහළ නැංවීම.

**3.0 අපේක්ෂිත ප්‍රතිඵල :**

පාසලෙහි අධ්‍යාපනය ලබන පාසල් හැර ගිය ළමයින්, තරුණ තරුණියන් හා වැඩිහිටියන් සඳහා ඔවුන් අපේක්ෂා කරනු ලබන දැනුම, ආකල්ප හා කුසලතා ලබා ගැනීමට සහය විය හැකි ගුරුවරුන් පිරිසක් අධ්‍යාපන පද්ධතියට දායාද කිරීම.

**4.0 අන්තර්ගතය**

**4.1** අධ්‍යාපනය සැම මානවයෙකුගේ ම අයිතිවාසිකමකි. එම අයිතිය තහවුරු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම රටක වගකීමකි. ශ්‍රී ලංකාවේ ළමයින්ට අධ්‍යාපනය සැලසීම සඳහා විධිමත් පාසල් පද්ධතියක් ක්‍රියාත්මක වේ. එම පාසල්හි තෝරා ගත් විෂය ධාරාවන් හැදෑරීමට සිසුන්ට අවස්ථා සලසා තිබේ. සිසුන් ඇගයීම සඳහා පොදු විභාග ක්‍රමයක් පවත්වාගෙන යන අතර එම විභාග ප්‍රතිඵල අනුව ශිෂ්‍යයාගේ ඉදිරි අධ්‍යාපනය හා අනාගතය තීරණය වේ.

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අපො.ස.(සා.පෙළ), අපො.ස.(උ.පෙළ) විභාගවලට පෙනී සිටින සිසුන්ගෙන් අපේක්ෂිත සාධන මට්ටමට ළඟා වනුයේ සීමිත පිරිසකි. මෙලෙස සමත් වන සිසුන් සියලු ම දෙනාටම උසස් අධ්‍යාපන සඳහා අවස්ථා නොලැබෙන අතර විභාග අසමත් වන සිසුන් පාසල් හැර යාමෙන් පසුව ඵලදායී පුරවැසියකු වශයෙන් ජීවත්වීම සඳහා සුදුසු වෘත්තීන්හි නිරත වීමට ඇති අවස්ථා ද ප්‍රමාණවත් නොවේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

අධ්‍යාපනයේ අරමුණ මෙන් ම සෑම පුරවැසියෙකුගේ ම අරමුණ වන්නේ රටට වැඩදායී යහපත් පුරවැසියෙකු වශයෙන් ජීවත් වීමට අවස්ථා ළඟාකර ගැනීමයි. මෙම අරමුණු කරා යාමට ප්‍රධාන මඟ පෙන්වන්නා වන්නේ ගුරුවරයා යි.

යම් ළමයෙකු පාසලට ඇතුළත් නොවීම, පාසල් අධ්‍යාපනය සම්පූර්ණ නොකර පාසල හැර යාම, විභාග ප්‍රතිඵල අනුව අවශ්‍ය සාධන මට්ටමට ළඟා නොවීම නිසා පාසල හැර යාම වැනි කරුණු පිළිබඳ ව ගුරුවරුන් නැවත නැවතත් විමර්ශනය කළ යුතුය. එම විමර්ශනයේ දී පහත සඳහන් ප්‍රධාන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

- **ශිෂ්‍ය විවිධත්වය අනුව ශිෂ්‍යයාට ඉගැන්වීම සිදුකර ඇති ආකාරය**
- **ශිෂ්‍යයා අපේක්ෂිත සාධන මට්ටමට නොපැමිණීමට හේතු අනාවරණය.**
- **ශිෂ්‍යයා තුළ ඇති විශේෂ අවශ්‍යතාවලට ගැළපෙන ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.**
- **ශිෂ්‍ය උපදේශනය හා මාර්ගෝපදේශනය පිළිබඳ ගුරුවරයාගේ ක්‍රියාකාරීත්වය**
- **පාසල් හැරයාමට ආසන්න සහ පාසල් හැරගිය සිසුන් රඳවා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග**
- **දෙමාපිය දැනුවත්කරණ සහ උපදේශනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග**
- ශිෂ්‍යයාගේ පවුල් පරිසරය අධ්‍යාපන සාධනය කෙරෙහි බලපෑම

මෙම කරුණු පරීක්ෂා කිරීමේ දී ඵලදායී පුරවැසියෙකු බිහිකිරීම සඳහා සැමට අධ්‍යාපනය සැලසීම හා විවිධත්වයට ගැළපෙන පරිදි අධ්‍යාපනය සැලසීම හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ශිෂ්‍යයාගේ සාධනය ඉහළ නැංවීම සඳහා ප්‍රගුණ කළ යුතු කුසලතා පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට අවස්ථාව සැලසෙයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**4.2 අනු මාතෘකා**

| අනු අංකය | මාතෘකාව | අන්තර්ගතය | ගුණාත්මක යෙදවුම්/සම්පත් | ක්‍රමවේදය | කාලය |
|---|---|---|---|---|---|
| සැසි අංක 01 | නොවිධිමත් අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය හැඳින්වීම. | ඇමුණුම 01 | සිද්ධි අධ්‍යයන පත්‍රිකාව | දේශන, සාකච්ඡා, කණ්ඩායම් ක්‍රියාකාරකම්, භූමිකා රංගන | පැය 04 |
| | අනිවාර්ය අධ්‍යාපන අවශ්‍යතාව හා ක්‍රියාත්මක කිරීම. | ඇමුණුම 02 | එම | එම | |
| | තරුණ හා වැඩිහිටියන් සඳහා ක්‍රියාත්මක කළහැකි වැඩසටහන් | ඇමුණුම 03 | එම | එම | |
| සැසි අංක 02 | ශිෂ්‍ය විවිධත්වය කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම හා ක්‍රමවේදය | ඇමුණුම 04 | එම | එම | පැය 04 |
| සැසි අංක 03 | දෙමාපිය උපදේශන අවශ්‍යතාව හා ක්‍රමවේදය | ඇමුණුම 05 | එම | එම | පැය 04 |
| | අන්තර්කරණය අධ්‍යාපනය සංකල්ප ක්‍රියාත්මක කිරීමේ දී අධ්‍යාපන වෘත්තිකයන්ගේ කාර්යභාරය | ඇමුණුම 07 | එම | එම | |
| සැසි අංක 04 | ගුරුවරයා විසින් ප්‍රදර්ශනය කළයුතු මෘදු කුසලතා | ඇමුණුම 06 | එම | එම | පැය 04 |
| සැසි අංක 05 | මෘදු කුසලතා සංවර්ධනය කිරීමේ ප්‍රවේශ හා ක්‍රියාකාරකම් | ඇමුණුම | එම | එම | පැය 04 |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ඇමුණුම 01**

**1.0 නොවිධිමත් අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය හැඳින්වීම.**

විධිමත් අධ්‍යාපනයෙන් ළඟාකර ගැනීමට නොහැකි වූ නිපුණතා නොවිධිමත් අධ්‍යාපනය තුළින් ළඟාකර ගැනීමට හැකියාව ලැබේ. නිශ්චිතව තීරණය කරන ලද විෂයයන් හැදෑරීමෙන් පසුව පොදු විභාග ක්‍රමයක් යටතේ සිසුන් ඇගයීමට ලක් කිරීම විධිමත් අධ්‍යාපනය යටතේ සිදු වේ. ඒ සඳහා ව්‍යුහගත වූ පාසල් පද්ධතියක් ද, මානව සම්පත් ද, අනෙකුත් අවශ්‍ය සම්පත් ද , නිශ්චිත කාලසටහනක් ද ක්‍රියාත්මක වේ.

පාසල් අධ්‍යාපනයට යොමු නොවූ, අධ්‍යාපනය සම්පූර්ණ නොකර පාසල් හැරගිය, පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කළ, උසස් අධ්‍යාපනයට යොමු වූ, රැකියාවල නියුක්ත හෝ රැකියාවල නියුක්ත නොවූ ඕනෑම අයෙකුට තමා අපේක්ෂා කරනු ලබන නව නිපුණතා ලබාගැනීම සඳහා නොවිධිමත් අධ්‍යාපනය යටතේ පහසුකම් සලසා ගත හැකිය.

යම් පුද්ගලයෙකුට තමා ප්‍රගුණ කර ඇති වෘත්තීයට අමතරව නැටුම්, නාට්‍ය, සූප ශාස්ත්‍රය, වෙදකම, නිවාස සැලසුම්, භාෂා, විවේකය ගත කිරීම, ක්‍රීඩා, ඇඳුම් මැසීම, මෝටර් කාර්මික ශිල්පය, විදුලි තාක්ෂණය, වඩු තාක්ෂණය, නිවාස තැනීම, සම් භාණ්ඩ නිෂ්පාදනය, පරිසර සංරක්ෂණය, විදේශගතවීමට අදාළ තොරතුරු සමීක්ෂණකට, ලිපිගොනු සැකසීම, ගැටලු නිරාකරණය ආදී විවිධ කාර්යයන් ඉටු කර ගැනීමට අවශ්‍ය කුසලතා සංවර්ධනයට අවශ්‍ය පාඨමාලා සංවිධානය කරගත හැකිය. මෙම පාඨමාලා අදාළ සුවිශේෂී කණ්ඩායම්වලට පහසු ස්ථානවල, පහසු කාල සටහන් අනුව නම්‍යශීලීව ක්‍රියාත්මක කළ හැකිය.

රටක පවත්නා සම්පත් ඵලදායී අයුරින් භාවිත කිරීම හා ඒ මඟින් රටේ ආර්ථික සංවර්ධනය වේගවත්කර ගැනීමට නොවිධිමත් අධ්‍යාපනය යොදාගත හැකිය. මෙම කරුණු සලකා බැලීමේදී විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය රටක ප්‍රජා සංවර්ධන සඳහා සමානුපාතිකව දායකවන ක්ෂේත්‍රයක් බව පෙන්වාදිය හැකිය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**1. 1 සිද්ධි අධ්‍යයනය**

දුෂ්කර ගම්මානයක ජීවත්වන , ජනගහනය 12,000ක් පමණ වේ. මෙම ගමෙහි පවුල් සංඛ්‍යාව 2400කි. ප්‍රධාන ජීවනෝපාය වී හා අතුරු බෝග ගොවිතැනයි. අවුරුදු 5- 14 වයසේ ජනගහනය 1700ක් පමණ වේ. මෙම ළමයින්ගෙන් 250ක පමණ පිරිසක් පාසල් නොයන අතර, ඉන් 25ක් කිසිම දිනක පාසල් ගොස් නැත. පාසල් නොයන ළමයින් නිවසේ සිටින කුඩා දරුවන් බලා ගන්නා අතර කුඹුරු වැඩවලට ද බාල සහෝදරයින් බලාගැනීමට ද උදව් කරති. තවමත් පාරම්පරික ක්‍රමවලට කෘෂිකාර්මික කටයුතු කරන බොහෝ දෙනෙක් නගරයේ වෙළෙන්දන්ට ණය වී සිටිති. ඔවුන් නෙළා ගන්නා සුළු අස්වැන්න ද ණය පියවීම සඳහා ලබා දෙන අතර නැවතත් පුරුදු පරිදි එම වෙළෙන්දන්ට ණය වීම නිරන්තරයෙන් දැකිය හැකි සිද්ධියකි. අසනීපවලට බෙහෙත් ගැනීම සඳහා රෝහල්වලට යාමට අකමැත්තක් දක්වන මොවුහු, ගමේ සිටින වෙද මහතාගෙන් ම ප්‍රතිකාර ගනිති. එයට අමතරව ලෙඩ රෝගවලින් මිදීම සඳහා යාගහෝම, බලිතොවිල් සිදු කිරීම ද නිතර දැකිය හැකිය. සොයාගත නොහැකි රෝගවලින් මිනිසුන් මියයන අතර ඉතා ගෞරවාන්විතව අවමංගල්‍ය කටයුතු කරති. අ.පො.ස.(උ.පෙළ) දක්වා අධ්‍යාපනය ලැබූ පිරිස, වැඩිහිටියන් ද ඇතුළත්ව 20 පමණ පිරිසකි. රජයේ රැකියාවල නියුතුව සිටින්නේ 03ක් පමණකි. එක් අයෙක් ගමේ තැපැල් කාර්යාලයේ ලිපි බෙදන අතර තවත් අයෙක් නගරයේ පාසලක මුරකරුවකු වශයෙන් ද, අනෙක් තැනැත්තිය පවුල් සෞඛ්‍ය සේවිකාවක් වශයෙන් ද සේවය කරති.

1.2 පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු කණ්ඩායම් සාකච්ඡා මඟින් ලබා දෙන්න.

1. ගමේ දියුණුව ගැන ඔබ සෑහීමට පත් වන්නේ ද?
2. ගමේ සංවර්ධනය සඳහා ගුරුවරයකු වශයෙන් ඔබට ඉටුකළ හැකි කාර්යයන් කවරේද?
3. ගමේ සංවර්ධනය සඳහා නොවිධිමත් අධ්‍යාපනය යටතේ යම් මෙහෙවරක් ඉටු කළ හැකි වේද?
4. ගමේ සංවර්ධනය සඳහා ඔබ යෝජනා කරන සැලැස්ම කුමක්ද?
5. මෙම ගම්මානය නිරූපණය කිරීමට හා ගැටලුවලට විසඳුම් ලබාදීම සඳහා භූමිකා රංගනයක් ඉදිරිපත් කරන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ඇමුණුම 02

**2.0 අනිවාර්ය අධ්‍යාපන අවශ්‍යතාවය හා ක්‍රියාත්මක කිරීම.**

අධ්‍යාපනය මානවයාගේ මූලික අයිතිවාසිකමකි. ලෝකයේ සෑම රටක් ම රටේ ජනතාවට අධ්‍යාපනය ලබාදීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ වී සිටිති. ශ්‍රී ලංකාව ද රටේ ජනතාවගේ අධ්‍යාපන අයිතිය පිළිගෙන ඇති අතර වයස අවුරුදු 5-14 වයසේ සිටින ළමයින්ට අනිවාර්ය අධ්‍යාපනය ලබාදීම සඳහා අනිවාර්ය අධ්‍යාපන නියෝග පනවා තිබේ. 1997 නොවැම්බර් 25 දිනැති 1003/05 අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම නියෝග සක්‍රීය කර තිබේ. මෙම නියෝගවල අර්ථය වන්නේ රජය විසින් අවුරුදු 5-14 වයසේ සියලු ම ළමයින්ට අධ්‍යාපනය ලබාගැනීම සඳහා පහසුකම් ලබා දිය යුතු බවයි.මෙවැනි නියෝගවලින් ලබාගත හැකි ප්‍රයෝජන වන්නේ, රටේ ජනතාවගේ සාක්ෂරතාව 100% දක්වා ඉහළ නැංවීමට අවකාශ ලැබීම හා රටේ ආර්ථික සංවර්ධනය සඳහා රටේ සෑම පුරවැසියකු ම දායක කර ගැනීමට අවස්ථාව ලැබීමයි. ජාත්‍යන්තර වශයෙන් සලකන විට මානව හිමිකම් සුරකින රටක් බවට ශ්‍රී ලංකාවට ගෞරවයක් හා පිළිගැනීමක් ලැබේ.

1997 අනිවාර්ය අධ්‍යාපන නියෝග අනුව දිවයින පුරා පහත සඳහන් අනිවාර්ය අධ්‍යාපන කමිටු ක්‍රියාත්මක වේ.

01. ළමයින් පාසලට පැමිණවීමේ කමිටුව. (ග්‍රාම නිලධාරී මට්ටම)

02. ළමයින් පාසලට පැමිණීම පරීක්ෂා කිරීමේ කමිටුව.(ප්‍රදේශීය ලේකම් කොට්ඨාස මට්ටම)

03. බලයලත් නිලධාරී (පළාත් මට්ටම)

මෙම කමිටුවල කාර්යභාරය පහසු කිරීම සඳහා පාසල් මට්ටමෙන් ළමයින් හඳුනා ගැනීමේ කමිටු පිහිටුවීමට ද ක්‍රියා මාර්ග ගෙන තිබේ.

ඉහත කී අවු 5-14 අනිවාර්ය අධ්‍යාපන වයස් සීමා අවු 5-16 දක්වා දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර එයට අදාළ ගැසට් නිවේදනය නිකුත් කිරීමට ප්‍රථම නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ලබාගැනීමට යොමු කර තිබේ.

එම අනුමැතිය ලැබීමෙන් පසුව අනිවාර්ය අධ්‍යාපන වයසේ ළමයින් රැකියාවල නියුක්ත කිරීම හෝ වෙනත් අධ්‍යාපන නොවන කාර්යයන්හි යොදවා ගැනීමට ආයතන හෝ පුද්ගලයන්ට අවස්ථාව නොලැබේ. මෙම ප්‍රතිපත්ති රටේ ආර්ථික සමාජ සංවර්ධනයට හේතුවන බැවින් පාසලේ ගුරුවරුන් මෙම රෙගුලාසි පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

**2.1 සිද්ධි අධ්‍යයනය**

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ගම්මානයක ජීවත්වන පවුල් කිහිපයක් පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි සාරාංශ කර තිබේ.

| අනු අංකය | පවුලේ ස්වභාවය | දරුවන් පිළිබඳ විස්තර |
|---|---|---|
| 01. | මව අවුරුදු 38, පියා අවුරුදු 44, පියා පමණක් කුලී වැඩ කරයි. මව 7 ශ්‍රේණිය දක්වා ද පියා 8 ශ්‍රේණිය දක්වා ද අධ්‍යාපනය ලබා ඇත. | අවු 5,7,9,10,17 වයසේ ළමයින් 05කි. වැඩිමහල් දරුවා ගරාජයක වැඩ ඉගෙනීමට ගොසිනි. දෙවැනි දැරිය නිවසක මෙහෙකාර සේවයේ යෙදී සිටී. තුන්වන දැරිය නිවසේ ම සිටී. 4වන දැරියට ඇවිදීමට නොහැකිය. එහෙයින් ඇය පාසල් නොයයි. 5වන දරුවා 2016 වර්ෂයේ 1 ශ්‍රේණියට ඇතුළත් වීමට අපේක්ෂාවෙන් සිටී. |
| 02. | මව අවුරුදු 22, පියා අවුරුදු 23, පියා ත්‍රීරෝද රියදුරෙකි. මත්පැනට ඇබ්බැහි වී ඇත. මව පාසල් ගොස් නැත. පියා 9 ශ්‍රේණිය තෙක් පමණක් අධ්‍යාපනය ලබා ඇත. | අවුරුදු 3 දරුවෙක් ද, 2 දරුවෙක් ද, අවුරුදු 1 දැරියක් ද සිටිති. දරුවන් බලා ගැනීමට නෑදෑ දියණියක් රඳවාගෙන සිටියි. ඇයගේ වයස අවුරුදු 8කි. |
| 03. | මව අවුරුදු 40, පියා අවුරුදු 44, විවාහ වි නැත. පියා ගොවිතැන් කරයි. මව 5 ශ්‍රේණිය දක්වා ද පියා 9 ශ්‍රේණිය දක්වා ද අධ්‍යාපනය ලබා ඇත. | දරුවන් 3කි.<br>1 වයස අවුරුදු 12කි.(පි)<br>2 වයස අවුරුදු 11කි.(ගැ)<br>3 වයස අවුරුදු 8කි. (පි)<br>වැඩිමහල් දරුවා කඩයක වැඩ කරයි. දෙවැනි දැරිය පාසල්ගත කළද අසනිපව සතියකට දින 3ක් ම නිවසේ රැඳී සිටී. තුන්වන දරුවා පාසලට යාම ප්‍රතික්ෂේප කරයි. |
| 04. | මව මියගොස්ය. පියාට අවු. 49ක් හා සුළු මවට අවු. 42ක් වේ. (විවාහ වී නැත.) පියා සත්ව පාලනය කරන අතර ඔහු පියා 10 ශ්‍රේණිය තෙක්ද මව 9 ශ්‍රේණිය තෙක් ද අධ්‍යාපනය ලබා ඇත. | දරුවන් 4කි. වැඩිමහල් දරුවාට වයස අවු.11කි. දෙවැනි දරුවාට වයස අවු.10, තුන්වන දරුවා අවු.08 , දෙවන විවාහයෙන් දරුවෙක් සිටියි. ඇයට වයස අවු.1 ½යි. පළමු දරුවා සතුන් පාලනයට යොදවා ඇත. දෙවන දරුවා වැඩ අමාරු බව කියමින් පාසල් නොයයි. තුන්වන දැරිය නැගණිය බලා ගැනීමට නිවසේ සිටියි. |
| 05. | මවට අවුරුදු 32යි. පියාට අවුරුදු 34යි. පියා මුරකරු රැකියාවක යෙදී සිටියි. මව 9 ශ්‍රේණිය දක්වා ද පියා 10 ශ්‍රේණිය දක්වා ද අධ්‍යාපනය ලබා ඇත. | දරුවන් 2කි. වැඩිමහල් දරුවා අවු.12යි. දෙවැනි දරුවා අවු. 10කි. වැඩිමහල් දරුවා අසනීපයෙනි. පාසලට දුර වැඩි නිසා දෙදෙනා ම පාසල් නොයති. |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

2.2 ප්‍රශ්න - (කණ්ඩායම් සාකච්ඡා)

01.මෙම ළමයින් ලබන අධ්‍යාපනය ගැන ඔබේ අදහස් දක්වන්න.

02. අධ්‍යාපනය අහිමි වීමට හේතු විශ්ලේෂණය කරන්න.

03. අධ්‍යාපන පහසුකම් වැඩි කිරීමට ඔබට කළහැකි යෝජනා මොනවාද?

04. "ළමයින්ට අධ්‍යාපනය ලබාදීමේ අවශ්‍යතාව පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම "

භූමිකා රංගනයක් මඟින් ඉදිරිපත් කරන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



**3.0 තරුණ තරුණියන් හා වැඩිහිටියන් සඳහා ක්‍රියාත්මක කළ හැකි නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්**

ශ්‍රී ලංකාවේ සියලු ම තරුණ තරුණියන් රජයේ රැකියාවන්හි නියුක්ත නොවේ. එසේ වුවත් යහපත් පුරවැසියකු වශයෙන් ජීවත්වීම සඳහා කිසියම් ආදායම් ඉපයීමේ ක්‍රියාවලියක නිරතවීම අවශ්‍ය වේ. මේ සඳහා අවස්ථා සම්පාදනය කරදීමට නොවිධිමත් අධ්‍යාපනය සමත් වේ. විවිධ නිෂ්පාදන හෝ ව්‍යාපාරික අවස්ථා නිර්මාණය කර ගැනීම සඳහා කුසලතා ලබා දීමට නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් තුළින් හැකියාව ලැබේ.

මෙහිදී ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

* පරිගණක අලුත්වැඩියාව සහ ක්‍රියාත්මක කිරීම.
* ජංගම දුරකථන අලුත්වැඩියාව ආශ්‍රිත කාර්යයන්
* කිරි ආහාර නිෂ්පාදනය
* සත්ව පාලනය
* කෘෂිකර්මය
* මෝටර් කාර්මික ශිල්පය

තරුණ තරුණියන්ට හා වැඩිහිටියන්ට මූලික සාක්ෂරතාව නොමැති අවස්ථාවල සාක්ෂර පාඨමාලා මඟින් ඔවුන්ට සාක්ෂරතාව ලබා ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකිය. එමඟින් මෙතෙක් නොදැන සිටි අකුරු ලිවීම, කියවීම, ලිපි ලිවීම, පොත් ලිවීම ආදී කාර්යයන්හි නිරතවීමට අවස්ථාව ලැබේ.

එම වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් සාමාන්‍ය ගුරුවරයාට ද තම පන්ති කාමරයේ ඉගැන්වීමේ ක්‍රියාවලිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලැබේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**3.1 සිද්ධි අධ්‍යයනය**

ප්‍රජා සංවර්ධනය සඳහා සහය වන සංවිධානයක් විසින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයක ජීවත්වන තැනැත්තන් පිළිබඳ කරන ලද සමීක්ෂණයක් මගින් හඳුනාගෙන ඇති තොරතුරු පහත සඳහන් වේ.

කොට්ඨාසයෙහි අවු. 70ට වැඩි පිරිස - 10,000

කොට්ඨාසයෙහි අවු. 60 - 69 පිරිස - 14,000

කොට්ඨාසයෙහි අවු. 50 - 59 පිරිස - 16,000

කොට්ඨාසයෙහි අවු. 30 - 49 පිරිස - 20,000

කොට්ඨාසයෙහි අවු. 20 - 29 පිරිස - 17,000

කොට්ඨාසයෙහි අවු. 10 - 19 පිරිස - 8,000

කොට්ඨාසයෙහි අවු. 01 - 09 පිරිස - 7,000

අවු.60න් ඉහළ පිරිස රජයේ රැකියාවන්හි නිරතව විශ්‍රාම ලැබූ අය ද, ව්‍යාපාරිකයන් ද, පෞද්ගලික ආදායම් මාර්ග සහිතවූවන් ද වූහ. මොවුන්ගේ 10%ක් පමණ ඉල්ලා සිටියේ තමන්ගේ විවේකය අර්ථවත්ව ගත කිරීමට සහය වන ලෙසයි. අවු.50න් ඉහළ පිරිසගෙන් 10% පමණ ඉල්ලා සිටින්නේ නූතන ලෝකයට ගැලපෙන නව තාක්ෂණික ක්‍රමවේද පිළිබඳ දැනුමක් ලබා ගැනීමට අවශ්‍ය බවයි. අවු 20-49 පිරිසේ 10%ක් පමණ ඉල්ලා සිටින්නේ රැකියාවක් ලබා ගැනීම සඳහා අවශ්‍ය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සලසන ලෙසයි. අවු.10-19 වයස් කාණ්ඩයේ අයගෙන් 10%ක් ඉල්ලා සිටින්නේ උසස් අධ්‍යාපනය සඳහා අවශ්‍ය පහසුකම් ලබාදෙන ලෙසයි. ඇ.01 – 09 කාණ්ඩයේ දෙමාපියන්ගෙන් 10%ක් ඉල්ලා සිටින්නේ ළමයින්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය, පරිසරය, හා ආරක්ෂාව පිළිබඳව දැනුවත්වීම අවශ්‍ය බවයි.

**3.2 ප්‍රශ්න - (කණ්ඩායම් සාකච්ඡා)**

1. ඉහත එක් එක් කාණ්ඩයේ අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ඔබ කරන යෝජනා කවරේද?
2. අවශ්‍ය සේවා හා සම්පත් ලබා ගැනීමේ ක්‍රමවේදය විස්තර කරන්න
3. තෝරාගත් කාර්යයන් කිහිපයක් පිළිබඳව භූමිකා රංගනයක් ඉදිරිපත් කරන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



**4.0 ශිෂ්‍ය විවිධත්වය කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම හා ක්‍රමවේදය**

ගුරුවරයා යනු ඉගැන්වීමේ යෙදී සිටින වෘත්තිකයෙකි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහිදී ඉගැන්වීමෙහි යෙදී සිටින්නේ කාහටදැයි අවබෝධ කරගැනීම ගුරුවරයාගේ ප්‍රමුඛ කාර්යයකි. තම පන්ති කාමරයේ සිටින සිසුන් සංඛ්‍යාව පමණක් නොව ඒ එක් එක් ශිෂ්‍යයාගේ හැකියාවන්, දක්ෂතාවයන්, සීමාවන්, සියල්ලම ගුරුවරයාගේ අවධානයට ලක්විය යුතුය.

පන්ති කාමරය තුළ පහත සඳහන් ස්වභාවයේ සිසුන් සිටිය හැකිය.

- සුහග සිසුන්
- දෘෂ්ටි ඌනතා සහිත සිසුන්
- ශ්‍රවන ඌනතා සහිත සිසුන්
- ඕටිසම් තත්වය සහිත සිසුන්
- බුද්ධිමය ඌනතා සහිත සිසුන්
- දිගුකාලීන රෝග සහිතව සිටින සිසුන්
- ඉගෙනුම් දුෂ්කරතා සහිත සිසුන්
- චර්යා ගැටලු සහිත සිසුන්
- කායික දුබලතා සහිත සිසුන්
- ආර්ථික දුෂ්කරතා සහිත සිසුන්
- දෙමාපියන් අහිමි සිසුන්
- මාවත්වාසී දරුවන්
- භාරකරුවන් යටතේ සිටින සිසුන්

මෙම දරුවන්ට ඉගැන්වීම සඳහා විධිමත් තක්සේරුවක් කර ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. මේ සඳහා ගුරුවරයා විසින් නිරීක්ෂණය, පැවරුම් පත්‍ර, හා ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

එක් එක් ශිෂ්‍යයාගේ විවිධත්වය අවබෝධකර ගැනීමෙන් පසුව ශිෂ්‍ය ඉගැන්වීම් සැලසුම් සකස් ගැනීම සිදුකළ යුතුවේ. ඒ සමඟ ම එක් එක් කුසලතාවය ලබාදීම සඳහා යොදාගත යුතු ඉගෙනුම්, ඉගැන්වීම් උපකරණ පිළිබඳ මනා සූදානමකින් යුක්ත විය යුතුය. එක් එක් ශිෂ්‍යයා සමාන වේගයකින් සාධනයවීම සිදු නොවන බැවින් සුවිශේෂී පැවරුම් සකස්කර ගැනීමට ගුරුවරයා ක්‍රියා කළ යුතුය.

ශිෂ්‍ය විවිධත්වයට ගැලපෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදුවන විට සෑම ශිෂ්‍යයකුට ම අපේක්ෂිත ඉලක්කයට යාමට අවස්ථාව සැලසෙයි. මෙය ඕනෑම ගුරුවරයෙක් ලබන ජයග්‍රහණයකි.

## 4.1 සිද්ධි අධ්‍යයනය

පන්තියක සිටින සිසුන් පිළිබඳ කරන ලද නිරික්ෂණය තුළින් හඳුනාගත් තොරතුරු විශ්ලේෂණයක් පහත සඳහන් වේ.

| ශිෂ්‍යයාගේ නම | ස්වභාවය/ලක්ෂණ |
|---|---|
| A | පැමිණීම හොඳයි, සහයෝගය හොඳයි, කරුණු අවබෝධ කරගැනීම හොඳයි, සවන්දීම හොඳයි, හැසිරීම හොඳයි, පිරිසිදුකම හොඳයි. |
| B | පැමිණීම හොඳයි, සවන්දීම 60% පමණ, පන්තියේ ඝෝෂා කරයි, රණ්ඩු කරයි, අන් අයගේ දේවල් උදුරා ගනී, පිරිසිදුකම අඩුයි, කරුණු අවබෝධ කර ගනී. |
| C | පැමිණීම හොඳයි, බෑගයේ පොත් අඩුයි, පැන්සල් අමතක වී ඇත,ගුරුවරයා දෙන උපදෙස් නොපිළිපදී. ළමයින් කීප දෙනෙක් සමඟ පමණක් මිත්‍රශීලීයි. ආහාර ගැනීම තනිවමයි, සුළු දෙයකටත් හඬයි. |
| D | පැමිණීම හොඳයි, කථාව අඩුයි, ගුරුවරයා අසන දේට වැරදි පිළිතුරු ලබා දෙයි. පොතේ තමාට කැමති දේ ලියා ඇත, අන් අයගේ පොත් බලයි, මිතුරන් අඩුයි, ක්‍රීඩාවට නොයයි. |
| E | පැමිණීම හොඳයි, හුදකලාවී සිටියි, කළු ලෑල්ල ළඟටම ගොස් බලාගනී, නිතර ම ගුරුවරයා විමසයි, උපදෙස් කීප වරක් දිය යුතුයි, අන් පොත් බලයි, හෙමින් වැඩ කරයි, මතකය අඩුයි. |
| F | පැමිණීම හොඳයි, වහාම වැඩ අවසන් කරයි, කරන වැඩ නිවැරදියි, මිතුරන් සිටී, වැඩ අවසන් කළ වහාම තව වැඩ ඉල්ලයි, වැඩ නැතිවිට අන් ළමයින්ට බාධා කරයි, පැන්සල් උදුරා ගනියි, පන්තිය වටේ දුවයි. |
| G | පැමිණීම හොඳයි, ඕනෑම වැඩක් හරියටම කිරීමට උත්සාහ කරයි, වැඩ කිහිපයක් දුන්විට කලබල වේ, ඇසට ඇස බැලීමට අකමැතියි, උපදෙස් පිළිපදී, මිතුරන් නැත, ක්‍රීඩා වලට නොයයි. |
| H | සතියකට දිනක්වත් නොපැමිණේ, විරුද්ධව පැමිණිලි ලැබේ, දෙමාපියන් ද අසතුටින් කථා කරයි, පොත්පත් පිළිවෙළකට නැත.ඇඳුම් අපිරිසිදුයි, ළමයින්ට පහර දෙයි, පොත් ඉරයි, තමාම යමක් කර හඬයි. |

## 4.2 ප්‍රශ්න - (කණ්ඩායම් සාකච්ඡා)

**01.** මෙම ළමයින් ඔබ හඳුනාගත්තේ කවර ස්වභාවයේ අය ලෙසද?

**02.** මෙවැනි සිසුන් ඔබේ පන්තියේ සිටියි නම් එම ලක්ෂණ සහිත ළමයින් පිළිබඳව කණ්ඩායමට පැහැදිලි කරන්න.

**03.** මෙම ළමයින්ට ඉගැන්වීමට භාවිත කළහැකි ක්‍රමවේද මොනවාද?

**04.** ළමයින් ලෙස භූමිකා රංගනයක යෙදෙන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



**5.0 දෙමාපිය උපදේශන අවශ්‍යතාවය හා ක්‍රමවේදය**

"විවිධත්වයට" "Diversity " ගැලපෙන ලෙස ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී පාසල තුළ පමණක් නොව නිවසේදී ද ක්‍රියා කළ යුතු ආකාරය ගුරුවරයා හා දෙමාපිය දෙපාර්ශවය දැනුවත්වීම අවශ්‍ය වේ. මෙය ගෙදර වැඩ (Home Work) ඉටු කිරීම සඳහා උපදේශනයක් නොවේ.

ශිෂ්‍යයාට පාසලේ දී ඉගැන්වූ විෂය කරුණුවලට සමගාමීව, චර්යා හැඩ ගැස්වීම, කථනය දියුණු කිරීම, චාලක ක්‍රියාකාරකම් වර්ධනය කිරීම, ආහාර පුරුදු, දෛනික පුරුදු ආදී හඳුනාගත් ක්ෂේත්‍ර සංවර්ධනය කරමින් පෞරුෂ සංවර්ධනය සඳහා දෙමාපියන් සමඟ එක්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. එම පැවරුම් නිරන්තරයෙන් නියාමනය කරමින් ශිෂ්‍යයා පියවරෙන් පියවර අපේක්ෂිත සාධන මට්ටමට ළඟා කර ගැනීමට සැලසුම් සකස් කළ යුතු වේ. ප්‍රාථමික ගුරුවරයා මෙම සබඳතාවය පිළිබඳව දැඩි අවධානයක් යොමු නොකර ඊළඟ ශ්‍රේණියට සමත් කරන්නේ නම්, ශිෂ්‍යයාට ද, ගුරුවරයාට ද, දෙමාපියන්ට ද පැවරෙන කාර්ය භාරය වඩාත් පුළුල්වන අතර ම එය සංකීර්ණ ද වේ. එහි වඩාත් අයහපත් ප්‍රතිඵලය ලබනුයේ ශිෂ්‍යයාය. යම් වර්ධන අවදියක දී ළඟා කරගතයුතු නිපුණතාවයක් ළඟා කර ගැනීමට එම අවධිය තුළ සහය නොවීමෙන් ඊළඟ අවධියට ශිෂ්‍යයා ළඟා වන්නේ, අපේක්ෂා නොකරන ලද චර්යාවන් හා ගැටලු රාශියක් සමඟය. එම ගැටලු උග්‍ර තත්වයට පත් වූ විට ගුරුවරයාට ද, දෙමාපියන්ට ද, සම වයසේ කණ්ඩායම්වලට ද, පාසලට ද පෙනෙනුයේ එම ශිෂ්‍යයා, වඩාත් කරදරකාරී - පීඩාකාරී - අඩු සාධනයෙන් යුක්ත දරුවකු ලෙසයි.

ගුරුවරයෙක් වශයෙන් අප ළඟට එන ඕනෑම ශිෂ්‍යයෙකු සතුටින් පිළිගැනීමටත්, එම ශිෂ්‍යයා තුළ පවතින හැකියාවන් හඳුනාගනිමින් යහපත් දෙමාපිය සබඳතා පවත්වා ගනිමින් වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමටත් හැකිවන්නේ නම් සියලු ම ළමයින්ට එම අධ්‍යාපන අවස්ථා ළඟාකර දීමට අවස්ථාව උදාවනු ඇත.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**5.1 සිද්ධි අධ්‍යයනය**

ඔබගේ පන්ති කාමරයේ මෙවර සිටින ළමයින් සංඛ්‍යාව 35කි. මෙම ළමයින්ගෙන් පෙර පාසලට ගොස් ඇති සංඛ්‍යාව 22කි. පියා පමණක් සිටින දරුවන් 04කි. මව පමණක් සිටින දරුවන් සංඛ්‍යාව 06කි. පවුලේ මාසික ආදායම රු.5000/ ට අඩු ළමයින් සංඛ්‍යාව 20කි. මව/පියා රජයේ රැකියා කරන දරුවන් සංඛ්‍යාව 05කි. මව/පියා අ.පො.ස.(උ.පෙළ.) දක්වා අධ්‍යාපනය ලබා ඇති දරුවන් සංඛ්‍යාව 06කි. උදේ ආහාර ගෙනෙන සංඛ්‍යාව 31කි. චර්යා ගැටලු සහිත සංඛ්‍යාව 03කි. වයසට ගැලපෙන බර සහිත දරුවන් සංඛ්‍යාව 25කි. දිනපතා පාසල් පැමිණෙන ශිෂ්‍ය සංඛ්‍යාව 30කි. නිවසේ පාඩම් වැඩ කිරීමට ස්ථානයක්, මේසයක් නොමැති දරුවන් සංඛ්‍යාව 05කි.

**5.2 පැවරුම් - (කණ්ඩායම් සාකච්ඡා)**

01. මෙම දරුවන්ට ඉගැන්වීම සඳහා දෙමාපිය උපදේශන සහ අවශ්‍යතාව පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

02. දෙමාපිය උපදේශන වැඩසටහනක් සැලසුම් කර ඉදිරිපත් කරන්න.

03. තෝරාගත් ළමයින් සඳහා උපදේශන වැඩසටහනක් භූමිකා රංගනයකින් ඉදිරිපත් කරන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# මෘදු කුසලතා

## අරමුණු

### 6.0 ගුරු චර්යාවෙන් ප්‍රදර්ශනය කළ යුතු මෘදු කුසලතා

බහුවිධ භූමිකාවන් ප්‍රදර්ශනය කරන ගුරුවරයාට තම කාර්යයන්හි ඵලදායීතාව නිරතවීමට විෂය දැනුම පමණක් ප්‍රමාණවත් නොවේ. තමා උගන්වන විෂයයන්ට දැනුමත් ඒ දැනුම දරුවන්ට සම්ප්‍රේෂණය කිරීමට අවශ්‍ය වෘත්තීය ක්‍රමවේද (ඉගැන්වීමේ ක්‍රම) පමණක් එලියීවු ගුරු කාර්යයක නිරතවීමට ප්‍රමාණවත් නොවේ. වර්තමානයේ මෙම ක්ෂේත්‍රයන් දෘඪ කුසලතා (Hard Skills) යනුවෙන් හඳුන්වයි.

දෘඪ කුසලතාවන්ගෙන් පමණක් සවිබල ගැන්වී ගුරු කාර්යයේ නිරතවන ගුරුවරු බොහෝ පාසල්වල සිටිති. මෙම ගුරුවරුන් සිත්පිත් නැති පරිගනක/රොබෝ යන්ත්‍ර බඳුය.

වර්තමාන අධ්‍යාපන ක්‍රියාවලියට අවශ්‍යවන්නේ සිත්පිත් ඇති මානවීය චර්යාවන්ගෙන් සවිබල ගැන්වූ ගුරුවරුන්ය. මානවීය ප්‍රවේශය/මානවීය චර්යාවන්ගුරු චර්යාවෙන් විද්‍යාමාන වන්නේ මෘදු කුසලතාවන්ගෙන් ය. ගුරු කාර්යය වඩාත් ඵලියී වීමටත්, මානවීය ප්‍රවේශයක් ගැනීමටත් ඉගෙනුම් ලාභියාගේ සක්‍රීයදායකත්වය මෙන් ම සතුටින් මෙන් ම ප්‍රීතියෙන් ඉගෙනුම් කාර්යයේ නිරත කරවීමටත් ගුරුවරයා තම චර්යාවන් මෘදු කුසලතා (Soft Skills) ප්‍රදර්ශනය කළ යුතු වේ.

පුද්ගලික ජීවිතය මෙන් ම රාජකාරි ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා සියල්ලන්ට ම විවිධාකාර කුසලතා අවශ්‍ය වේ. ඕනෑම දෙයක් කිරීමේ දී කරන්නේ මොනවා ද? යනුවෙන් අවබෝධයක් තිබිය යුතු ය. එයට පිළිතුර වන්නේ දෘඪ කුසලතා (Hard Skills) යන්නයි. කරන්නේ කෙසේ ද? යන්නට ලැබෙන පිළිතුර මෘදු කුසලතා (Soft Skills) ක්ෂේත්‍රයට ඇතුළත් වේ.

වර්තමානයේ වඩා අවධානය යොමුවන්නේ දෘඪ කුසලතාවන්ට ය. සුදුසුකම් හා තාක්ෂණික හැකියාවන්, විෂය දැනුම හා විෂය හැකියාවන් වශයෙන් ද විස්තර වන්නේ දෘඪ කුසලතාවන් ය.

සෑම සමාජ තලයකම ඵලදායී ලෙස තම කාර්යයන්හි නිරතවීමට දෘඪ කුසලතාවන් පමණක් ප්‍රමාණවත් නොවන අතර දෘඪ කුසලතාවන් සමග මෘදු කුසලතාවන් ද නව චර්යාවෙන් ප්‍රදර්ශනය කිරීම අත්‍යවශ්‍ය වී ඇත්තේ අදාළ පාර්ශවකරුවන් සමග මානවීය ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ය. විශේෂයෙන් ම මානව සබඳතා හා මානවීය බලපෑම් ඵලදායී ව ඉටු කර ගැනීමේ දී වඩාත් ම අවශ්‍ය වන්නේ මෘදු කුසලතාවන් ය.

මෘදු කුසලතාවන් එක් රැයකින් වර්ධනය කර ගත නොහැකි ය. පාසල හැර ගියාට පසුව හෝ රැකියාවක් ආරම්භ කිරීමෙන් පසුව හෝ මෘදු කුසලතාවන් පුරුදු පුහුණු කිරීම අපහසු වේ. මනෝ විද්‍යාඥයින්ගේ අදහස වන්නේ මෘදු කුසලතාවන් කුඩා අවධියේ සිට, සෙසු කුසලතාවන් සංවර්ධනය කරන්නාක් මෙන් පියවරෙන් පියවර අඛණ්ඩව පුරුදු පුහුණු කිරීම අවශ්‍ය බවය. යම් තනතුරක් සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවීම් කිරීමේ දී සමාන වූ දෘඪ කුසලතා ඇති අයදුම්කරුවන් ඉදිරිපත් වේ. නමුත් ඔවුන් එකිනෙකාට වෙනස් වන්නේ ඔවුන් පෙන්වන මෘදු කුසලතාවන් නිසා ය. දෘඪ කුසලතාවන් විවිධ ක්‍රමවේද හා ප්‍රවේශයන් භාවිතා කරමින් මැනිය හැකි අතර (Measure) මෘදු කුසලතාවන් එසේ මැනිය නොහැකි ය.

**මෘදු කුසලතාවන් පහත දැක්වෙන ක්ෂේත්‍ර ඔස්සේ වර්ග කළ හැකි වේ.**

- සන්නිවේදන සඳහා මෘදු කුසලතා
- නායකත්ව සඳහා මෘදු කුසලතා
- තිරණ ගැනීම සඳහා වු මෘදු කුසලතා
- අන්තර් සබඳතා සඳහා මෘදු කුසලතා
- පෞරුෂ සංවර්ධනය සඳහා වු මෘදු කුසලතා
- නිර්මාණකරණය සඳහා වු මෘදු කුසලතා
- පුද්ගල යහපැවැත්ම සඳහා වු මෘදු කුසලතා

**මෘදු කුසලතා යනු කවරේ ද?**

- බහුවිධ බුද්ධිම හැකියාවන් විස්තර කිරිමේදී භාවමය බුද්ධිමය හැකියා ලෙස මෘදු කුසලතා හඳුන්වා ඇත.

**මෘදු කුසලතාවන්**

**ගුරු චර්යාව**

- මානවීය ප්‍රවේශයකට යොමු කරයි.
- ඔපවත් කරයි
- පහසු කරයි
- ආකර්ශණය කරයි
- අර්ථවත් කරයි
- ප්‍රිය මනාප කරයි
- කාර්යක්ෂම කරයි
- එපමණක් නොව මෘදු කුසලතා
- ඵලියි අන්තර් පුද්ගල සබඳතා ඇති කර ගැනීමට
- නිවැරදි තිරණ ගැනීමට
- ඵලියි සන්නිවේදනයේ නිරතවීමට
- ධනාත්මක(ශුභවාදී) වු ගුරු වෘත්තීය චර්යාවේ නිරත වීමට ියක වෙයි.

ගුරු වෘත්තියේ නිරතවන ආධුනික ගුරුවරුන් මෙන් ම අත්දැකීම් සහිත ගුරුවරුන්ගේ ගුරු චර්යාවන් තුළින් මෙම මෘදු කුසලතාවන් විවිධ මට්ටම්වලින් විද්‍යාමාන වේ. මෘදු කුසලතා කිසිවක් නොමැති ගුරුවරු නොමැත. කිසිවකු හිස් භාජන සේ සැළකිය නොහැක. ගුරුවරුන් විසින් කළ යුතු වන්නේ තමා සතුව ඇති මෘදු කුසලතා/මෘදු චර්යාවන් තව තවත්සංවර්ධනය කර ගැනීමයි. වඩ වඩා අභ්‍යාසයන්හි නිරත වී එම කුසලතාවන් වර්තායනය කර ගැනීමයි. එවිට ඔබේ ඇසුර ලබන ඔබේ ශිෂ්‍යයින් ද මෘදු කුසලතා ප්‍රගුණ කිරීමට, වර්තායනය කර ගැනීමට නිරායාසයෙන්ම යොමුවනු ඇත. අනාගතයේ දී විෂය දැනුම, විෂය කුසලතා මෙන් මෘදු කුසලතාවලින් ද පරිපූර්ණ වු පුරවැසියෙක් ලෙස රටට/ලෝකයට දායක වේ.

මෙම ඒකකය අධ්‍යයනයෙන් ගුරුවරුන් වන ඔබට ඔබ සතුව ඇති පහත දැක්වෙන මෘදු කුසලතාවන් සංවර්ධනය කර ගැනීමට හැකි වනු ඇත.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

මෘදු කුසලතා - ආදරය කරුණා යන සරල සංකල්පයේ සිට නායකත්වය ගැටුම් නිරාකරණය නිර්මාණාත්මක චින්තනය, තිරණ ගැනිම වැනි සංකීර්ණ චර්යාවන් දක්වා ව්‍යාප්ත වේ.

- සන්නිවේදන කුසලතා(හිංසාවෙන් තොර සන්නිවේදනය/ක්‍රියාකාරි සන්නිවේදනය)
- සහානුභූතිය
- අවංක බව
- සාධාරණත්වය
- අන්‍යයන් පිළිබඳ සැලකිලිමත් බව
- බේ හි ගැනීම
- ආදරය
- කරුණාව
- සහ මන්ත්‍රණය
- සහයෝගය
- සාමුහිකත්වය
- ගෞරව දැක්වීම
- අගය කිරීම
- නායකත්වය
- තීරණ ගැනීම
- ගැටලු/ගැටුම් නිරාකරණය
- කාල කළමනාකරණය
- ආතතියෙන් තොරව කාර්යයේ නිරත වීම
- විවෘත බව
- නම්‍යශීලි වීම
- අන්තර් පුද්ගල සබඳතා
- නිර්මාණාත්මක බව
- වගකීම් භාරගැනීම
- ස්වයං පෙළඹවීම
- නිතිගරුක වීම/ආචාරශීලි වීම
- සම්පත් භාවිතය හා සම්පත් ආරක්ෂා කිරීම
- අන්‍යයන් පුබුදුවාලීම
- පෙළඹවීම
- තමා පිළිබඳ අවබෝධය
- තමා පිළිබඳ විශ්වාසය
- තමා පිළිබඳ ඇගයීම
- මිත්‍රශීලි බව
- උද්යෝගය (උනන්දුව)
- පුද්ගලික හා වෘත්තිය ජීවිතය
- සමබර බව
- සංවිධානය
- සැලසුම

ඉහත දක්වා ඇති මෘදු කුසලතා /මෘදු චර්යාවන් වර්ධනය කර ගැනීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් තුළින් මග පෙන්වීමක් ලැබෙනු ඇත. ගුරුවරයාට ද තම ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී මෙන්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ම විවේකී අවස්ථාවල දී හෝ ශිෂ්‍යයින් සමග මෙවැනි ක්‍රියාකාරකම් කිරීමෙන් සිසුන්ගේ මෘදු කුසලතා සංවර්ධනය කිරීමට දායක වීමට හැකි වේ.

**මෘදුකුසලතා සංවර්ධනය කිරීමේ ප්‍රවේශ හා ක්‍රියාකාරකම්**

**ක්‍රියාකාරකම් අංක 1**

**ක්‍රියාකාරකම** - ආචාරශීලී වෙමු. එකිනෙකා හඳුනා ගැනීම

**අරමුණ** - එකිනෙකා හඳුනා ගනිමින් ආචාරශීලී වීම, නීතිගරුක වීම, අන්‍යයන්ට ගරු කිරීම හා අන්‍යයන්ට සවන් දීම යන මෘදු කුසලතා වර්ධනය කර ගැනීම

**ඉගෙනුම්ඵල**

- එකිනෙකාට ගරු කරමින් ආචාරශීලීව පිළිගනියි.
- අන්‍යෝන්‍ය අවබෝධයෙන් කටයුතු කරයි.
- අන්‍යයන්ට ක්‍රියාකාරීව සවන් දෙයි.
- තම හැකියා/දක්ෂතා අන්‍යයන්ට හිරිහැරයෙන් නොවන අයුරින් ප්‍රදර්ශනය කරයි.
- අවිහිංසාවාදී සංනිවේදනයේ යෙදෙයි.

**කාලය** - එක් අයෙකුට මිනිත්තු 1 බැගින් සහභාගිවන්නන් සියලු දෙනාටම කාලය ලබා දෙන්න.

**ක්‍රියාවලිය** - සහභාගිවන්නන් කවයක ආකාරයකට අසුන් ගන්වන්න.

- කවය මැද ක්‍රියාකාරකමට සුදුසු වන පරිදි අවකාශය සකස් කරගන්න.
- සම්පතියක (ගුරුවරයා) කවය මැදට ගොස් තමා වඩාත් කැමති ක්‍රියාකාරකමක නිරත වෙමින් කවය තු හෙමින් හෙමින් ගමන් කරන්න. (උදාහරණ: ගීතයක් ගායනය කිරීම අභිරූපණය, රූපික රංගනයක් අදහස් ඉදිරිපත් කිරීමක්).
- තම ක්‍රියාකාරකමෙහි නිරතවෙමින්, අසුන්ගෙන සිටින අයෙකු වෙත ගොස් ආචාර කර ඇය/ඔහු පිළිගෙන කවය මධ්‍යයට පැමිණීමට ආරාධනා කර එම අසුනේ වාඩිවෙන්න.
- ක්‍රියාකාරකම කණ්ඩායම් සාමාජිකයින්ට අවබෝධ නොවූයේ නම් යළි එය පැහැදිලි කරමින් නැවත ආදර්ශනය කරන්න.
- අදාළ ක්‍රියාකාරකමෙහි දිගින් දිගටම නිරතවෙමින්, සියලුම සාමාජිකයින් හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- සියලු දෙනාම ක්‍රියාකාරකමෙහි නිරත වී අවසන් වූ පසු පහත දැක්වෙන කරුණු මත කරමින් සහභාගිවන්නන් සමග කෙටි සංවාදයක යෙදෙන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ක්‍රියාකාරකම අංක 2**

**ක්‍රියාකාරකම** - සිත, කය, සංවර කර ගනිමු.

**අරමුණ** - සහභාගිවන්නන් තුළ සිත/කය සංවර කර ගනිමින් සංවරශීලීව තම කාර්යයන්හි නිරත වීමේ හැකියාව වර්ධනය කිරීම

**ඉගෙනුම් ඵල** -

- කායික හා මානසික සංවර බව ප්‍රදර්ශනය කරයි
- කෘතවේදී බව ප්‍රකාශ කරයි.
- ආවර්ජනය කිරීමට යොමුවෙයි.

**කාලය** - විනාඩි 10 යි (ක්‍රියාකාරකම කිරීමට)

විනාඩි 10 යි (සාකච්ඡා කිරීම)

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම අංක 1 හෝ එම සංකල්ප රිද්මයානුකූල සටහන් කළ කැසට් පටයක්

**පෙර සූදානම** - ඇමුණුම අංක 1 හෝ ඒ අනුව සකස් කරගත් කැසට් පටය භාවිත කිරීමට පුහුණු වන්න.

**ක්‍රියාවලිය** -

- නිදහස් අවකාශයක් තෝරාගන්න
- සහභාගිවන්නන්ට නිදහසේ සෙමින් ඇවිදයාමට උපදෙස් ලබාදෙන්න.
- ඇවිදගෙන යන අතරතුර තමා ඉදිරියට හමුවන අයට ප්‍රසන්න සිනහවකින් සංග්‍රහ කරන ලෙස උපදෙස් ලබා දෙන්න.
- පරිසරයේ නිහඬ බව අතරින් ඇමුණුම අංක 1 ක්‍රියාත්මක කරන්න.

- ක්‍රියාකාරකම පිළිබඳ සහභාගි වන්නන්ගේ අදහස් විමසන්න.
- එම ක්‍රියාකාරකමෙහි නිරත වීමෙන් කුමන මෘදු කුසලතා ඉස්මතු වුයේ ද?

ආචාරශීලි වීම/නීතිගරුක වීම

අන්‍යයන්ට සවන්දීම හා අදහස් ප්‍රකාශනය

අන්‍යයන්ගේ ඉදිරිපත් කිරීම් අගය කිරීම

අන්‍යයන් පිළිබඳ අවබෝධය/හඳුනා ගැනීම

වැනි කරුණු සාකච්ඡාවට යොමු කරන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ඇමුණුම අංක 1**

**උපදෙස් පත්‍රිකාව**

අවකාශය තුළ ඉතාම සෙමින් ඇවිදයාමට අවස්ථාව ලබාදෙන්න.

- එසේ ඇවිද යන අතරතුර දී ඉදිරියට හමුවන අය සමග සුහද සිනාසී, ආචාරශීලීව ඔබ ඔවුන්ව පිළිගන්නා බව යම් ඉරියව්වකින් ප්‍රදර්ශනය කර යළි සෙමින් ඇවිද යාමට අවස්ථාව ලබා දෙන්න.
- එසේ ඇවිද යන ගමනේ දී එක් අයෙකු ඉදිරියේ නතර වීමට උපදෙස් දෙන්න.
- ඔහුගේ/ඇයගේ දෑත් අල්ලාගෙන මුහුණට මුහුණලා සිටගෙන සිටීමට හෝ බිම වාඩි වීමට උපදෙස් දෙන්න.
- දෑස් පියා ගැනීමට අවස්ථාව දෙන්න.
- හුස්ම ඉහළට ගෙන යළි එය පහ හෙළීමට (වාතලයට) සෙමින් මුසු කිරීමට අවස්ථාව ලබා දෙන්න
- දැන් ඔබ සෙමින් සෙමින් අතීතය කර යන බව පවසන්න

- ඔබේ ජීවිත ගමනට (අතීතයේ සිට අද දිනය දක්වා) විවිධාකාරයෙන් උදව් කළ අය සිහියට නංවාගෙන ඒ සියල්ලන්ට ස්තුති කිරීමට උපදෙස් දෙන්න. (ඒ සියලු දෙනාම කෘතවේදී ව සිහිපත් කරන්න. ස්තුතිවන්ත වෙන්න. අගය කරන්න)

පහත ගීත කාණ්ඩයට නිහඬව සවන් යොමු කර වන්න

අම්මාගේ උකුලේ නැලවී
තාත්තාට සුරතල් වෙවී
පාසල් ගොසින් උයද කාලේ
ගතවීලා යයි මාගේ බාලේ

- දැන් ඔබ යළි තරුණ වියට පැමිණ ඇතැයි පවසන්න.

ගෞරවනිය වන්දනීය වෘත්තියක හිමිකරුවෙකු සුදුසු බව සෙමින් පවසන්න.

- දැන් ඔබ සිටි ස්ථානයේ/ අවට පරිසරයේ සුන්දර බව මතක් කර දෙන්න.
- මේ ගීත කාණ්ඩය සෙමින්, රිද්මයානුකූලව ගායනා කරන්න.

සැංගී සැංගී ඈත සූර්යයා දිලෙන්නා//
නිල් අහස පුරා රංචු ගැසී පක්ෂීන් පියඹන්නා
ශෝභාව නැගෙවී - අරුණෝදේ සුන්දරා//

දැන් සුන්දර මනසකින් ඔබේ අධ්‍යාපනයේ වගකීම භාර ගැනීමට ඔබ සූනම් බව පවසන්න.

දරුවන් වෙනුවෙන් ඔබ කරන සියලුම අධ්‍යාපන ක්‍රියාවලියක දී ම ශක්තිමත්ව හැසිරෙන්නට ඔබට ශක්තිය හා ධෛර්යය ලැබේවා යන ප්‍රාර්ථනය කරන්න.

සෙමින් දෑස් විවර කරන්නට උපදෙස් දෙන්න.

ක්‍රියාකාරකම අවසානයේ පහත දැක්වෙන කරුණු ඉස්මතු කරමින් සහභාගිවන්නන් සමග සාකච්ඡාවක යෙදෙන්න.

- මෙම ක්‍රියාකාරකමෙහි නිරත වීමෙන් සහභාගිවන්නන් ලැබූ අත්දැකීම් සාකච්ඡා කරන්න.
- ගුරු චර්යාවේ වර්ධනය ට යොමු වූ මෘදු කුසලතා කවරේ ද?
- සංවර බව/ සංගමය
- ඉවසීම
- ආචාරශීලී වීම/කෘතවේදී බව/ අගය කිරීම
- ආතතියෙන් තොරවීම
- සිත/ගත සන්සුන්වීම
- ස්වයං විනය/හික්මීම
- මෙවැනි අභ්‍යාසයන් පන්ති කාමරයේ දරුවන් සමග ද කළ හැකි බව ඔවුන් තුළ මෙවැනි මෘදු කුසලතා වන් වර්ධනයට යොමුවිය හැකි බව
- තම වෘත්තිය චර්යාවට මෙවැනි ක්‍රියාකාරකම් අන්තර්ගත කළ යුතු බව

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ක්‍රියාකාරකම අංක 3**

**ක්‍රියාකාරකම** - උසම නිර්මාණය ගොඩ නගමු

**අරමුණ** - සහයෝගීව/ සාමූහිකව කටයුතු කිරීමේ කුසලතා වර්ධනය කිරීම

- නිර්මාණාත්මක චින්තනය සංවර්ධනය කිරීම

**ඉගෙනුම් ඵල**

- කණ්ඩායමක් ලෙස සහානුභූතියෙන් සහයෝගයෙන්, සාමූහිකව කටයුතු කර ඉලක්ක සපුරා ගනියි.
- අන්‍යයන්ගේ අදහස්වලට ගරු කරමින්, අන්‍යයන් පිළිබඳ සැලකිලිමත් වෙමින් කාර්යයේ නිරතවෙයි.
- හිංසාවෙන් තොර සන්නිවේදනයේ නිරතවෙයි.

**කාලය** - විනාඩි 30 යි

**ගුණාත්මක යෙදවුම්**

- බීම බට, කතුරු, උපදෙස් පත්‍රිකාව

**පෙර සූදානම** එක් කණ්ඩායමකට බීම බට 12ක් ලැබෙන සේ කණ්ඩායම් ගණනට අවශ්‍ය බීමට බට ප්‍රමාණය සහ එක් එක් කණ්ඩායමට කතුරක් බැගින් සපයා දෙන්න.

උපදෙස් පත්‍රිකාව සකස් කර ගන්න.

**ක්‍රියාවලිය** -

- එක් කණ්ඩායමකට සාමාජිකයන් 4 -5 වනසේ සහභාගි වන්නන් කණ්ඩායමේ කරන්න.
- බීම බට, කතුරු, යනාදී ගුණාත්මක කණ්ඩායම්වට ලබාදෙන්න.
- උපදෙස් පත්‍රිකාව කියවන්නට අවස්ථාව දෙන්න නැතිනම් සම්පතියක විසින් පොදු කණ්ඩායම් විස්තර පත්‍රිකාවේ ඇතුලත් කරුණු පැහැදිලි කරන්න.
- ක්‍රියාකාරකමෙහි නිරත වීමට විනාඩි 15 ක කාලයක් ලබා දෙන්න.
- ජයග්‍රාහකයන් තෝරන්න
- එක් එක් කණ්ඩායමේ අදහස් විමසමින් පහත දැක්වෙන කරුණු ඉස්මතු කරමින් සමාලෝචනය කරන්න

- කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේදී ජයග්‍රහණය සඳහා ලැබුණු සහාය හා මතු වූ බාධක කවරේ ද?
- වර්ධනය වූ මෘදු කුසලතා/මෘදු චර්යාවන් කවරේ ද?
- සහයෝගය සාමූහික බව, එකමුතු බව, නම්‍යශීලී වීම, හිංසාවෙන් තොර සන්නිවේදනය, නිර්මාණශීලී චින්තනය, උදව් කිරීම, බෙදා හදා ගැනීම, තීරණ ගැනීම අන්තර් පුද්ගල සබඳතාව නායකත්වය වැනි මෘදු කුසලතා වර්ධනයට දායක වූ ආකාරය සාකච්ඡා කරන්න
- දරුවන් සමග ද මෙවැනි ක්‍රියාකාරකම්හි නිරත වීමෙන් ඔවුන්ගේ මෘදු කුසලතා වර්ධනය ගුරුවරයාට දායක විය හැකි බව.

විධිමත් විෂයමාලාව ක්‍රියාත්මක කිරීම තුළින් මෘදු කුසලතා වර්ධනය අනිවාර්යයෙන් ම කළ හැකි ය. එහි දී කුමන විෂයක විෂය අන්තර්ගතයක් වුවද ගුරුවරයා භාවිත කරන ඉගැන්වීමේ ක්‍රමවේද තුළින් හා ගුරුවරයාගේ ගුරු චර්යාව තුළින් මෘදු කුසලතා පිළිබඳ අවම බවක් දරුවන් තුළල වර්ධනය කළ හැකි වේ. පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන සියලු ම විෂයයන්ට අදාළ විෂය අන්තර්ගතයක් තුළින් ගුරුවරයාට එය කළ හැකි ය. මෙහි දී ඔබට උදාහරණ ලබා දෙන්නේ පුරවැසි අධ්‍යාපනය විෂයේ විෂය අන්තර්ගතය තුළිනි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ක්‍රියාකාරකම 1**

**ශ්‍රේණිය** - 7

**නිපුණතාව** - සාරධර්ම ගරුකරමින් ආදර්ශවත්ව කටයුතු කරයි

**නිපුණතා මට්ටම** - සාර්ථක දිවි පෙවතක් සඳහා සාර්ධර්ම උපයෝගී කර ගනියි.

**විෂය අන්තර්ගතය**

- සාරධර්ම යනු මොනවාදැයි ඉගෙන ගැනීම
- සාරධර්මවල විවිධත්වය හඳුනා ගැනීම

**අරමුණු** - නිවසේ දී පාසලේ දී සහ අවට පරිසරයේ දී සංවර්ධනය කරගත යුතු සාරධර්ම වෙන්වශයෙන් ඉගෙන ගනිමින් ඒ ඒ අවස්ථාවන්හි දී එම සාරධර්ම නිවැරදිව භාවිත කිරීම

**ඉගෙනුම් ඵල** -

- සාරධර්ම යනු කවරේදැයි නිර්වචනය කරයි
- මෘදු කුසලතා ද සාරධර්මවලට ඇතුලත් වන යහචර්යාවන් බව පැහැදිලි කරයි
- පාසලේ දී සංවර්ධනය කරගත යුතු විවිධ සාරධර්ම/ මෘදු චර්යාවන් ගොනු කරයි
- නිවසේ දී සහ පරිසරයේ දී සංවර්ධනය කරගත යුතු සාරධර්ම/මෘදු චර්යාවන් වෙන් වෙන්ව ගොනු කරයි.

පාසලේ දී නිවසේ දී සහ පරිසරයේ දී සංවර්ධනය කරගත යුතු සාරධර්ම/මෘදු කුසලතා/ මෘදු චර්යාවන් ඇසුරෙන් නිර්මාණ සකස් කරයි.

**කාලය** විනාඩි 80 යි (කාලච්ඡේද 02 යි)

ක්‍රියාකාරකම් සඳහා විනාඩි 60 යි

සමාලෝචනය සඳහා විනාඩි 20 යි

**ගුණාත්මක යෙදවුම්** - ඇමුණුම් 1.1, 1.2, 1. 3, 1.4

**පෙර සූනම** - ඇමුණුම 1.1, 1.2, 1.3 සකස් කර ගන්න

ක්‍රියාකාරකමට අවශ්‍ය උපදෙස් පත්‍රිකාව සකස් කර ගන්න (ඇමුණුම 1.4)

විනාඩි 10 ක කාලයක් කණ්ඩායමක් සේ එය කියවීමට අවස්ථාව දෙන්න.

**ක්‍රියාවලිය** - ඉඩකඩ ඇති අවකාශයක් තෝරා ගන්න. (එලිමහනෙන් වුවද සුදුසු ය.)

- ඇමුණුම 1.2 හි සඳහන් ආකාරයට සකස් කරගත් කාඩ්පත් 3ක් එකිනෙකට ඈත්ව සිටින සේ පොළව මත තබන්න. (හොඳින් ප්‍රදර්ශනය වන පරිදි)
- ඇමුණුම 1.3 හි සඳහන් තොරතුරු ලියූ කාඩ්පත් , මිටියක් වන සේ සකස් කර වැඩමුළුව පැවැත්වෙන ස්ථානයේ ම පහසු තැනක තබන්න.
- ක්‍රියාකාරකම ආරම්භ කළ පසුව එම ගොනුවෙන් එක් කාඩ්පත බැගින් ලබා ගැනීමට උපදෙස් දෙන්න.
- තමන් ලබාගත් කාඩ්පත ගැළපෙන්නේ කුමන ස්ථානයට දැයි තීරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මෙම ක්‍රියාවලිය නිසා නිරායාසයෙන් ම කණ්ඩායම් තුනක් නිර්මාණය වේ.
- කණ්ඩායම් 3ට ඇමුණුම 1.1 ලබා දී කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- ඇමුණුමේ සඳහන් තොරතුරු අනුව තමා තෝරාගත් කණ්ඩායම නිවැරදි දැයි තීරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායම් වීම නිවැරදි දැයි පරීක්ෂා කරන්න
- ඉහත ක්‍රියාවලිය අවසන් වූ පසුව උපදෙස් පත්‍රිකාව (1.4) ලබා දෙන්න.
- කණ්ඩායම් අනුව වාචිකව තොරතුරු ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව ලබා දෙන්න
- පහත දැක්වෙන කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවමින් ඉදිරිපත් කරන තොරතුරු ගැලීම් සටහනකින ඉදිරිපත් කරන්න.

- අපේ ජීවිත ලස්සන කරන, පොහොසත් කරන අර්ථවත් කරන සහ ප්‍රීතිමත් කරන හැඟීමක් හෝ ගුණයක් මෙන් ම ක්‍රියාවක් ද සාරධර්ම/මෘදු චර්යා/මෘදු කුසලතා වන බව
- විවිධ මිනිසුන් ජීවත්වෙන සමාජයක සිටින අපට සාරධර්ම/මෘදු කුසලතා/ මෘදු චර්යාවන් ඉතා වැදගත් බව
- පංති කාමරය අවට පිරිසිදු කිරීම - ගුරුවරුන්ට කීකරු වීම. විනීතව හැසිරීම. මිත්‍රශීලීව කටයුතු කිරීම, සුහදව කථාබහ කිරීම, අන්‍යයන්ට උපකාර කිරීම, පාසලේ සම්පත් පරිහරණය කිරීම මෙන් ම සම්පත් ආරක්ෂා කිරීම. පාසල තුළ දී අප විසින් දියුණු කරගත යුතු සාරධර්ම/ මෘදු චර්යාවන්/මෘදු කුසලතා වේ.
- දෙමව්පියන්ට/භාරකරුවන්ට ආදර කිරීම, කීකරු වීම, උදව් උපකාර කිරීම, වැඩිහිටියන්ට ගරු කිරීම, සියලු දේ පවුලේ සැමදෙනා සමග සාධාරණව බෙදා ගැනීම, නිවසේ බඩු බාහිරාදිය (සම්පත්) පරිහරණය කිරීම, ආරක්ෂා කර ගැනීම, නිවස අවට පරිසරය පිරිසිදුව තබා ගැනීම ආදිය නිවසේදී දියුණු කරගත යුතු සාරධර්ම/මෘදු චර්යාවන්/ මෘදු කුසලතාවන් වේ.
- වන සතුන් ආරක්ෂා කිරීම, පරිසරයට ආදරය කිරීම, වනාන්තර ආරක්ෂා කිරීම, පසෙහි සෝදා පාලුව වැලැක්වීම,ගස් සිටුවීම, ජලය අපවිත්‍ර කිරීමෙන් වැලකී සිටීම, වැලි ගොඩ දැමීම වැලැක්වීම, මල් වර්ග වැවීම, පරිසරයට විෂ දුම් එකතු කිරීමෙන් වැලකීම, වන උයන් ආරක්ෂා කිරීම පරිසරය හා බැඳුණු අප විසින් දියුණු කර ගනු ලැබිය යුතු සාරධර්ම/ යහ චර්යාවන්/ යහ පුරුදු වේ.
- සාකච්ඡා කරමින් කලු ලැල්ලේ ගොඩ නැගූ ගැලීම් සටහන අභ්‍යාස පොතට සටහනක් සේ ලබා දෙන්න.
- විෂය කරුණු ඉගැන්වීමේ ක්‍රියාවලිය තුළින් සාරධර්ම/ මෘදු කුසලතා/ මෘදු චර්යාවන් ඉස්මතු කිරීමට හැකි බව ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් ම සහභාගිවන්නන්ට අත්දැකීම් ලැබුණු බව
- විෂය කරුණු , විෂය කරුණු ඉගැන්වීමේ ක්‍රමවේද පමණක් නොව ගුරුවරයාගේ පෞරුෂ තුළින්/ ගුරුවරයාගේ හැසිරීම් රටාව තුළින් ද ශිෂ්‍යයින්ට මැනවින් ප්‍රදර්ශනය විය යුතු බව
- ගුරුවරයාගේ කථා බහ, ඉගෙනුම සඳහා ශිෂ්‍යයින්ට ලබා දෙන සහයෝගීතාව, උපකාරී වීම, ශිෂ්‍යයින්ගේ ගැටලු විසඳීම්, හා ඒ සඳහා ලබා දෙන විවිධාකාර වූ සහාය ක්‍රියාවන් තුළින් පෙන්වන මානවීය චර්යා ලක්ෂණ ද ශිෂ්‍යයින් තුළ සාරධර්ම/ මෘදු කුසලතා/ මෘදු චර්යාවන් වර්ධනය කිරීමෙහි ලා ඇඩි ලෙස අවශ්‍ය වන බව
- ගුරුවරයා මේ චර්යාවන් චරිතායනය කරගත් ආකෘතියක් ලෙස තම කාර්යයේ නිරත වීමට උත්සාහ ගත යුතු බව.

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com
ප්‍රශ්න පත්‍ර ඇතුළු බොහෝ PDF දේ ආකාරයෙන් නොමිලේ ලබා ගන්න..
ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com
ප්‍රශ්න පත්‍ර ඇතුළු බොහෝ PDF දේ ආකාරයෙන් නොමිලේ ලබා ගන්න..

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ඇමුණුම 1.1**

**සාරධර්ම සුරකිමු**

මිනිසුන් වන අපට විවිධ ස්ථානවල දී විවිධ පුද්ගලයින් හා ජීවත්වමට සිදු වෙයි. ඔවුන්ගෙන් අපට ජීවත්වීමට විශාල පිටිවහලක් ලැබේ. මිනිසුන් වන අප තුළ සුහද වුත්, ගෞරවනිය වුත් හැගීම් තිබීම ඉතාම වැදගත් ය.

පාසල අපේ ඉගෙන ගන්නා ආයතනය යි. පංති කාමරය අවට පිරිසිදු කිරීම, ගුරුවරුන්ට ගෞරව කිරීම, ගුරු උපදෙස්වලට අවනත ව කටයුතු කිරීම, පාසල් පරිසරය තුළ විනීත ව හැසිරීම, සියලු දෙනා සමග මිත්‍රශීලී ව කටයුතු කිරීම, සුහද කථා බහ කිරීම, අවස්ථානෝචිත ව අන්‍යයන්ට උපකාර කිරීම, පාසලේ සම්පත් ආරක්ෂා කිරීම ආදිය අපට පාසලේ දී රැකීමට හැකි සාරධර්ම වෙයි.

එමෙන් ම නිවසේ දී රැකිය හැකි සාරධර්ම ද රාශියක් තිබේ. මව්පියන්ට හෝ භාරකරුවන්ට ආදරය කිරීම, කීකරු වීම, උදව් කිරීම, වැඩිහිටියන්ට ගරු කිරීම, ආහාරපාන හා වෙනත් පහසුකම් නිවසේ සියලුදෙනා සමග සාධාරණ ලෙස බෙදා හදා ගැනීම, නිවසේ භාණ්ඩ හා උපකරණ ප්‍රවේශමෙන් පරිහරණය කිරීම, නිවස හා අවට පිරිසිදු ව තබා ගැනීම, තමාගේ කටයුතු තමා විසින් ම කර ගැනීම, නෑ මිතුරන් සුහද ව පිළිගැනීම, පවුලේ ගෞරවය ආරක්ෂා කිරීම ඒ අතර වැදගත් වෙයි.

පරිසරය හා බැඳුණු සාරධර්ම රැකීම ද අපගේ යුතුකමකි. වන සතුන් ආරක්ෂා කිරීම, පරිසරයට ආදරය කිරීම, කැලෑ ආරක්ෂා කිරීම, පස සෝදා පාළුව වැළැක්වීම, වැලිගොඩ දැමීම වැළැක්වීම, මල්වර්ග වැවීම, පරිසරයට විෂ දුම් එකතු කිරීමෙන් වැළකීම, වන උයන් ආරක්ෂා කිරීම ඒ අතර වැදගත් සාරධර්ම වේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ඇමුණුම 1.2**

(1)

පාසලේ දී සංවර්ධනය කර ගන්නා සාරධර්ම

(2)

නිවසේ දී සංවර්ධනය කර ගන්නා සාරධර්ම

(3)

පරිසරයේ දී සංවර්ධනය කර ගන්නා සාරධර්ම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



| |
|---|
| පංති කාමරය හා අවට පිරිසිදු කිරීම. |
| ගුරුවරුන්ට ගෞරව කිරීම. |
| ගුරු උපදෙස්වලට අනුව කටයුතු කිරීම |
| විනීතව හැසිරීම |
| සියලුදෙනා සමග මිත්‍රශීලී ව කටයුතු කිරීම. |
| සුහද ව කථා බහ කිරීම |
| අවස්ථාවෝචිත ව අන්‍යයන්ට උපකාර කිරීම |
| පාසලේ සම්පත් ආරක්ෂා කිරීම |
| දෙමව්පියන්ට ආදරය කිරීම |
| කීකරු වීම |
| වැඩිහිටියන්ට උදවු කිරීම |
| ආහාර පානාදිය සමසේ බෙදා ගැනීම |
| ගෘහ උපකරණ ප්‍රවේශමෙන් පරිහරණය කිරීම |
| තමාගේ කටයුතු තමා විසින් ම කර ගැනීම |
| නෑ මිතුරන් සුහද ව පිළිගැනීම |
| පවුලේ ගෞරවය ආරක්ෂා කිරීම |
| වන සතුන් ආරක්ෂා කිරීම |
| පරිසරයට ආදරය කිරීම |
| ගස් සිටුවීම |
| ජලයට අපද්‍රව්‍ය එක් කිරීමෙන් වැළකීම |
| වැලි ගොඩ දැමීමෙන් වැළකීම |
| වන උයන් ආරක්ෂා කිරීම |
| වනාන්තර ආරක්ෂා කිරීම |
| මල් වර්ග වැවීම |
| පරිසරයට විෂ දුම් එකතු කිරීමෙන් වැළකීම |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## උපදෙස් පත්‍රිකාව

- පාසලේ දී සංවර්ධනය කර ගතයුතු සාරධර්ම පිළිබඳ ව කණ්ඩායම එකතු වී වාචිකව තොරතුරු ඉදිරිපත් කිරීම සිදු කරන්න.

- නිවසේ දී සංවර්ධනය කරගත යුතු සාරධර්ම පිළිබඳ ව කණ්ඩායම් අදහස් ඉදිරිපත් කරන්න.

- පරිසරයේ දී සංවර්ධනය කරගත යුතු සාරධර්ම පිළිබඳ ව කණ්ඩායම් අදහස් ඉදිරිපත් කරන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## 7.0 අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය ක්‍රියාත්මක කිරීමේ දී අධ්‍යාපන වෘත්තිකයන්ගේ කාර්යභාරය

අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය නව සංකල්පයක් නොවේ. ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ විවිධ වූ අවශ්‍යතා සහිත ළමයින් අධ්‍යාපනය ලැබූ බවට ඉතිහාසය සාක්ෂි දරයි. විවිධ ආබාධ සහිත තත්වයන්ට ලක්වූ ළමයින් ද , මාවත්වාසීව සිටි ළමයින් ද දැඩි දරිද්‍රතාවයෙන් සිටි ළමයින් ද විවිධ චර්යා ගැටලු සහිත ළමයින් ද , මව, පියා අහිමිවූ ළමයින් එකම පන්ති කාමරයේ දී අධ්‍යාපනය ලබාදීමට අතීතයේ ගුරුවරයා සමත්කම් දක්වා ඇත. එවැනි ළමයින් එක්ව අධ්‍යාපනය ලබා ගැනීම පිළිබඳව සමාජය තුළ ද යහපත් ආකල්ප පැවතුණි.

ජාත්‍යන්තර වශයෙන් සලකන විට සැමට අධ්‍යාපන සංකල්පය තුළින් ගම්‍ය වන්නේ ද අන්තර්කරණ අධ්‍යාපනයේ අවශ්‍යතාවයි. විවිධ ගැටලු සහ ආබාධ සහිත තත්ත්වයන් පවතින ළමයින් සඳහා වෙන් වූ පාසල් හෝ විශේෂ අධ්‍යාපන ඒකක පවත්වාගෙන යාමට ක්‍රියාකර ඇතත් එය ශිෂ්‍යයාගේ සාධනය සඳහා යහපත් ක්‍රියා මාර්ගයක් නොවේ. වෙන්ව ඉගැන්වීමට වඩා අනෙකුත් ළමයින් සමඟ ඉගෙනීමට අවස්ථාව ලැබීමෙන් ඔවුනොවුන්ගේ කුසලතා ඉහළ නැංවීමට හේතුවේ.

මෙහිදී පන්ති කාමර ගුරුවරයා පෙන්වා දෙන කරුණු වන්නේ ශිෂ්‍ය සංඛ්‍යාව අධික පන්ති කාමරයකදී අඩු සාධනය සහිත සිසුන් රඳවා තබා ගැනීමෙන් පන්ති කාමර ක්‍රියාවලියට බාධාවක් ඇති වන බවයි. අධ්‍යාපන අරමුණු තරඟකාරීව අධ්‍යාපනය ලබා විභාග සමත්වීම පමණක් නම් එය පිළිගත හැකිය. එහෙත් අධ්‍යාපනයේ අරමුණු වන්නේ යහපත් පුරවැසියන් බිහි කිරීම නම් සියලු ම ළමයින් එක්ව , එකට අධ්‍යාපනය ලබා ගැනීමෙන් දැනුම, ආකල්ප, කුසලතා, වඩාත් හොඳින් සිදුවන බව පෙන්වා දිය හැකිය. සමහර ළමයින් අධ්‍යාපනයට අසමත් යැයි අප තීරණය කළ , සිතූ, බැහැර කළ ළමයින් කොපමණ දෙනෙක් යහපත් මිනිසුන් ලෙස ජීවත් වනවාද? මෙවැනි කරුණු පිළිබඳ ආවර්ජනය කළ හැකි නම්, ගුරුවරයා වශයෙන් අපගේ භූමිකාව කොතරම් පුළුල් දැයි යන්නත් කොතරම් අගනේ ද යන්නත් අවබෝධ කරගත හැකිය.

**7.1 සිද්ධි අධ්‍යයනය**

පහත සඳහන්වන දෙබස් අධ්‍යයනය කරන්න.

| අනු අංකය | පියා | විදුහල්පති | ගුරුවරයා |
|---|---|---|---|
| 01 | මගෙ දරුවට පිටි එක හැදෙනව සර්. ඒකයි පාසල් පැමිණීම දුර්වල. දැන් බෙහෙත් බොන නිසා දරුවට පාසල් එන්න පුළුවන් වෙයි. | දැනට පළමු වාරයට දින 16න් පාසලට පැමිණිලා නැහැ. මේ දරුව අස්කර ගන්න. මට වගකීම ගන්න බැහැ. වෙනත් පාසලකට දාගන්න ළමයව. | ඔව් සර්. මටත් මේ ළමය මහ වදයක්. කිසිම දෙයක් මතක නැහැ. නැවත නැවත මට උගන්වන්න බැහැ. හරිම දුර්වල ළමයෙක්. අනික පොත්පත් ටිකවත් හරියට අරන් දීලා නැහැ. |
| 02 | සර්, මේ දරුවගෙ අම්මා දාලා ගිහිල්ල තමයි. ඒත් මම දරුවව බලා ගන්නව. අවශ්‍ය දේවල් සියල්ලම දෙනවා. මට දෙන්න පුළුවන් අධ්‍යාපනය විතරයි, ඒ නිසා මේ ළමයව පාසලට ඇතුළත් කර ගන්න සර්. | මේ ළමයගෙ අම්මා කරන රස්සාව මම දන්නවා. මේ වගේ ළමයෙක් පාසලට ගත්තොත් මට අනෙක් දෙමව්පියන්ගෙන් බේරෙන්න බැහැ. ගිහිල්ලා වෙනත් පාසලකට දාගන්න. මට කරදර කරන්න එන්න එපා. | මේ ළමයගෙ අම්මා කරන්නේ ---------------- රස්සාවනෙ. ඒක ප්‍රසිද්ධයිනෙ. ඉතිං කොහොමද මගෙ පන්තියට මේ ළමයව අර ගන්නේ. සර් එහෙම කියපු එක හොඳයි. |
| 03 | මේ ළමයා දැන් ඉන්නෙ ළමා නිවාසෙ, අම්මලා තාත්තලා දාලා ගිහිල්ලා හොඳ දක්ෂ ළමයෙක්, අපේ ආයතනය මේ ළමයට අවශ්‍ය සියලුම දේවල් අපි ලබා දෙනවා. පාසලට ඇතුළත් කර ගන්න. | මේ වගේ ළමයි මේ පාසලට ඇතුළත් කරන්නේ නැහැ. මේ අය අනික් ළමයින්ට කරදර කරනවා. ගෙදරක්වත් නැති ළමයි කොහොමද අපි පාසලට ගන්නේ. වෙනත් පාසලකට දාන්න පුළුවන්ද කියලා බලන්න. | සර්, ළමා නිවාසවල ඉන්න ළමයින්ට නරක පුරුදු තියනවලු. මේ ළමය ගත්තොත් අපේ ළමයින්ටත් ඒ පුරුදු ඇති වෙයි. පාසලක් නැත්නම් අපි මොනවා කරන්නද සර්. |
| 04 | සර්, මගෙ දරුවට පෝලියෝ නිසා ඇවිදින්න බැහැ. රෝද පුටුවක් හොයා ගන්නකල් මම වඩාගෙන හරි පාසලට ගේන්නම්. අනේ සර්, මගේ දරුවත් පාසලට ගන්න. | ඇවිදින්න බැරුව කොහොමද ඉගෙනගන්නෙ. ඊටත් මේ පංතිය තියෙන්නේ උඩ තට්ටුවක ආබාධිත අයට වඩා හොඳින් ඉන්න අයට උගන්නලා ඉන්න ඕනැ. මට නම් මේ ළමයව ගන්න බැහැ. | අපි කොහොමද සර් ඇවිදින්න බැරි ළමයි පංතියට දාන්නේ.ඒ අය බලාගන්න තවත් අය ගන්නවේවි. එහෙට මෙහෙට යන්න වුනහම මටයි ඒකටත් කරගහන්න වෙන්නෙ. මමත් කැමති නැහැ සර් ගන්නවට. |

| | | | |
|---|---|---|---|
| 05 | සර්, මෙයා පුංචිකාලේ කරපු වරදකට උසාවියෙන් ළමා සුරැකුම් නිවාසෙකට දැම්මා. ඒ නිසා වයස අවු.06ක් වෙනවා. දැන් හොඳට ඉගෙන ගන්නවා.මේ අවුරුද්දෙ 1 පන්තියට ඇතුළත් කරල දෙන්න සර්. | පරිවාසගත කරපු ළමයි කොහොමද මේ පාසලට ගන්නේ? අනෙක් ළමයිනුත් නරක් වෙනව ඔය වැඩේ කලොත්. ඔයා ගිහින් වෙනත් පාසලක් හොයා ගන්න. | මම හිතුවෙ සර් ළමයව පාසලට ගනියි කියලා. ඔය වගේ ළමයි කොහොමද සර් පාලනය කරන්නේ.අනික දැන් ඉගෙන ගන්නෙ නැහැ . වයසත් වැඩියිනේ. |
| 06 | සර්, මගෙ ළමය මොන්ටිසෝරි ගියා. නටන්න, ගයන්න, ලියන්න හරිම දක්ෂයි. දොස්තර මහත්වරු කියන්නෙ සාමාන්‍ය පංතියකට දාන්න කියලා.ඩවුන් සින්ඩ්‍රෝම කියලා රෝගයක්ලු මෙයාට තියෙන්නෙ.පෙනුම වෙනස් වුනාට හරිම සීදේවි ළමයා පාසලට ගන්න සර්. | මොංගල් ළමයින්ට වෙනම පාසල් තියෙනව. අපේ පාසලට මේ ළමයින් ගන්න බැහැ. මේ අයට ඉගෙනගන්න බැහැනෙ. අපේ ගුරුවරුත් කැමති නැහැ. ළමයව ගන්න බැහැ. | මේ වගේ ළමයින්ට වෙනම පාසල් තියෙනව සර්. අපේ පංතියට අරගෙන මොනව කරන්නද? කෙල ගහනවලු, ළමයින්ට ගහනවලු, ගුරුවරුන්ටත් ගහනවලු. අනේ සර්, මේ ළමයා ගන්න නම් එපා. |

7.2 පැවරුම් (කණ්ඩායම් සාකච්ඡා)

1. මෙම ළමයින්ගේ ස්වභාවය කුමක්ද ?

2. දෙබස්වල අඩංගුවන කරුණු ගැන ඔබට හැගෙන කරුණු මොනවාද?

3. ඔබ විදුහල්පති/ගුරුතුමා නම් ඔබේ තීරණය කුමක්ද?

4. මෙවැනි ළමයින් පිළිබඳව භූමිකා රංගනයක යෙදෙන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**තේරීම් වර්ගයේ (බහුවරණ) ප්‍රශ්ණ – 10**

**(නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.)**

1. අනිවාර්ය නියෝග යටතේ ප්‍රාදේශිය ,පළාත්, කොට්ඨාස මට්ටමින් පිහිටුවන කමිටුව වන්නේ (ළමයින් පාසලට පැමිණීමේ කමිටුව - බලයලත් නිලධාරියා සහිත කමිටුව - ළමයා පාසලට පැමිණීම වාර්තා කරන කමිටුව) ය.
2. සංඥා භාෂාව අවශ්‍ය වන්නේ ( ශ්‍රවණය අඩු සිසුන් - ඌන දෘෂ්ටික සිසුන් - ඇසීම නැති සිසුන්) සඳහා ය.
3. සංශෝධනය කිරිමට යෝජිත අනිවාර්ය අධ්‍යාපන නියෝග අනුව අනිවාර්ය අධ්‍යාපන නව වයස් සීමාව වන්නේ (අවු 05-18, අවු 5-14,අවු 5-16) ය.
4. වර්ණ දේහවල අසමතුලිතතාවය අනුව බිහිවන දරුවන් හැඳින්වෙන්නේ(මස්තිෂ්ක අසාතය, අපස්මාරය, ඩවුන් සින්ඩ්‍රෝම) ළමයින් වශයෙනි.
5. සැලසුම් සහගත ස්ථානයක , කාලසටහනට අනුව , නිශ්චිත විෂය මාලාවකට අනුව ක්‍රියාත්මක වන්නේ (විධිමත් අධ්‍යාපනය , නොවිධිමත් අධ්‍යාපනය , අවිධිමත් අධ්‍යාපනය)වේ.
6. ශිෂ්‍යයෙකුට අභිප්‍රේරණය කිරිම සඳහා වඩාත් යෝග්‍ය ක්‍රමයක් වන්නේ (කැමති ක්‍රීඩාවක නියැලිමට අවස්ථාව ලබාදීම, ශාරීරිකව දඩුවම් කිරිම, ලබාදුන් ත්‍යාග ආපසු ලබා ගැනීම.)
7. විශේෂ අවශ්‍යතා සහිත දරුවෙකුට පුහුණුව ආරම්භ කිරිමට වඩාත් සුදුසු වයස වන්නේ (අවු.05, අවු 01, උපන්දා) සිට
8. මෘදු කුසලතාවට අදාළ නොවන්නේ (පෙලඹවීම, මිත්‍රශීලී බව, සාධාරණත්වය, පරිපූරබත්වය)
9. ගුරුවරයෙකුගේ මෘදු කුසලතාවයක් වන්නේ (නවීන තාක්ෂණය භාවිතයට ගුරුවරු ප්‍රවීණතාව ලබා තිබීම, භාෂාව නිවැරදිව ලිවීමේ හැකියාව, සහයෝගයෙන් කණ්ඩායමක් ලෙස ක්‍රියා කිරීම, නිවැරදි ඉගෙනුම් උපකරණ භාවිතය)
10. විවිධත්වය අනුව එක්ව අධ්‍යාපනය ලබා ගැනීමට පහසුකම් සැලසිම (ඒකීයකරණය, අන්තර් කරණය,විශේෂිකරණය) නමින් හඳුන්වයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**සැපයීම් වර්ගයේ කෙටි පිළිතුරු සඳහා වන ප්‍රශ්න (10)**

I. අනිවාර්ය අධ්‍යාපන නියෝග අදාළ වන්නේ කුමන දරුවන් සඳහාද ?

II. ගුරු භූමිකාවට ඇතුළත් ප්‍රධාන කරුණු 03 ක් නම් කරන්න.

III. විශේෂ අවශ්‍යතා සහිත සිසුන් යනුවෙන් හඳුන්වන්නේ කවුරුන්ද?

IV. විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට ඉගැන්වීමේදී අනුගමනය කළ හැකි ප්‍රධාන ක්‍රමවේද 02 ක් දක්වන්න.

V. විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ දෙමාපිය උපදේශන වැඩසටහනකදී පැහැදිලි කළයුතු ප්‍රධාන කරුණු 03 ක් ලියන්න.

VI. ශිෂ්‍යයා ඉගෙනුමට පෙළඹවීම සඳහා භාවිතා කළ හැකි අභිප්‍රේරණ විධි 03 ක් ලියන්න.

VII. නොවිධිමත් අධ්‍යාපනය යටතේ ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් 03 ක් නම් කරන්න.

VIII. විශේෂ අධ්‍යාපන ගුරුවරයෙකු තුළ තිබිය යුතු සුවිශේෂී ගුණාංග 03 ක් නම් කරන්න.

IX. ගුරුවරයෙකු විසින් ප්‍රදර්ශනය කළ යුතු මෘදු කුසලතා 03ක් නම් කරන්න.

X. ගුරුවරයාට මෘදු කුසලතා අවශ්‍ය වීමට හේතු 03ක් දක්වන්න